ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2017 අගෝස්තු මස 03 වැනි දින** |

## මුදල් ප්‍රතිපත්ති විවරණය : අංක 05 – 2017

දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය බව 2017 අගෝස්තු මස 02 වැනි දින පැවති රැස්වීමේ දී මුදල් මණ්ඩලයෙහි අදහස වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

ඉහත තීරණය ගැනීමෙහිලා පවතින සහ අපේක්ෂිත දේශීය හා විදේශීය සාර්ව ආර්ථික වාතාවරණය මෙන්ම මැදිකාලීනව උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ පවත්වා ගැනීමේ අවශ්‍යතාව මුදල් මණ්ඩලය විසින් සැලකිල්ලට ගනු ලැබීය.

2017 ජූලි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද 'ලෝක ආර්ථික ඉදිරිදැක්ම' (World Economic Outlook) ප්‍රකාශනයෙහි නවතම නිකුතුවට අනුව ගෝලීය ආර්ථික වර්ධනය ක්‍රමයෙන් ශක්තිමත් වන බව පෙනී යයි. 2017 වසරේ පළමු කාර්තුව තුළදී ශ්‍රී ලංකා ආර්ථිකයෙහි අඩු වර්ධනයක් දක්නට ලැබුණද, ඉදිරි කාර්තු තුළදී ආර්ථිකය මධ්‍යස්ථ ලෙස යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෘෂිකර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් වර්ධනය වීම සහ කර්මාන්ත හා සේවා

ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යහපත් ක්‍රියාකාරීත්වය මෙන්ම, ජී.එස්.පී. ප්ලස් (GSP+) සහනය නැවත ලබා ගැනීම ආර්ථික වර්ධනය සඳහා දායක වනු ඇතැයි අපේක්ෂිතය.

ප්‍රධාන වශයෙන්, ගංවතුර හේතුකොට ගෙන 2017 මැයි මාසයේ දී සැපයුම් අංශයෙහි ඇති වූ අවහිරතා මධ්‍යයේ වුවද, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද. 2013 = 100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද. 2013 = 100) මත පදනම්ව මනිනු ලබන මතුපිට උද්ධමනය මෑත මාසවලදී වැඩි වේගයකින් මන්දගාමී විය. මෙම කාලපරිච්ඡේදය තුළදී මූලික උද්ධමනය ද ඒ හා සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2015 වසර අවසානයේ සිට ක්‍රියාත්මක වූ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ උද්ධමනය මත බදු ව්‍යුහයේ එක් වරක් පමණක් සිදු වූ බලපෑම පහව යෑම හේතුවෙන් 2017 වසර අවසානය වන විට උද්ධමනය තවදුරටත් මන්දගාමී වනු ඇතැයි ද ඉන් පසු කාලය තුළ ස්ථාවරව පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

එසේ වුවත්, මුදල් ප්‍රසාරණය 2017 මැයි මාසයේ මෙන්ම ජුනි මාසයේදී ද අඛණ්ඩව ඉහළ අගයක පැවතුණි. මුදල් වර්ධනය ප්‍රධාන වශයෙන්ම දේශීය ණය ප්‍රසාරණය මත පදනම් වූ අතර, බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් ද මෙම ප්‍රසාරණය සඳහා හේතු විය. මේ අතර, 2016 වසර තුළදී සහ 2017 මුල් භාගයේ දී ඉහළ මට්ටමක පැවති පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය මෑතකාලීනව අඩු වේගයකින් වුවද පැහැදිලි ලෙස මන්දගාමී වීමක් පෙන්නුම් කළේය. වෙළඳපොළෙහි පවතින ඉහළ නාමික සහ මූර්ත ණය පොලී අනුපාතික හේතුවෙන් මුදල් සහ ණය සමස්ත වර්ධනය වසරේ ඉතිරි කාලසීමාව තුළදී තවදුරටත් මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රජයේ සුරැකුම්පත් වෙළඳපොළ ඵලදා අනුපාතිකවල මෑතකාලීනව සිදුවූ පහළ යෑම ඉදිරි කාලයේ දී අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික වෙත ද ක්‍රමිකව සම්ප්‍රේෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විදේශීය අංශය සැලකූ විට, කෘෂිකාර්මික අපනයන වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන අපනයන ක්‍රියාකාරකම් අඛණ්ඩව වැඩිදියුණු විය. කෙසේ නමුත්, ආනයන වියදම් අඛණ්ඩව ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත වෙළඳ හිඟය තවදුරටත් පුළුල් විය. 2017 ජුනි මාසයේ දී සංචාරක පැමිණීම් සහ සංචාරක ඉපැයීම් මන්දගාමී වේගයකින් වර්ධනය වූ අතර, මැද පෙරදිග කලාපයේ පවතින ආර්ථික හා භූ-දේශපාලනික අර්බුද හේතුවෙන් 2017 වසරේ පළමු භාගය තුළ දී විදේශ සේවා

නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව අඩු විය. එසේ වුවද, රාජ්‍ය සුරැකුම්පත් සහ කොළඹ කොටස් වෙළඳපොළ ඇතුළුව ප්‍රාග්ධන වෙළඳපොළ වෙත 2017 මාර්තු මාසයේ සිට සැලකිය යුතු ලෙස ශුද්ධ විදේශීය ලැබීම් දක්නට ලැබිණි. මේ අතර, ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ එ.ජ. ඩොලර් මිලියන 167.2 ක වටිනාකමින් යුතු තුන්වැනි වාරිකය ලැබිණි. මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, 2017 ජූලි මාසය අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.7 ක් ලෙස පැවතුණි. වැඩිදියුණු වූ ආයෝජන විශ්වාසය සහ අපේක්ෂිත සෘජු ආයෝජන ලැබීම් මගින් විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, 2017 ජූලි මාසය අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 2.6 කින් අවප්‍රමාණය වී ඇත.

මෙම පසුබිම තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 යන දැනට පවතින මට්ටමේ පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය:** | **ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවතී** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)<br>නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 7.25<br>සියයට 8.75 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 7.50 |

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2017 සැප්තැම්බර් මස 26 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**සංඛ්‍යා ඇමුණුම:**

## සංඛ්‍යා සටහන 01 : උද්ධමනය

| මාසය | | දෙසැ-16 | මාර්-17 | අප්‍රේ-17 | මැයි-17 | ජුනි-17 | ජූලි-17 |
|---|---|---|---|---|---|---|---|
| මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස %) | කො.පා.මි.ද. (2013=100) | 4.5 | 7.3 | 6.9 | 6.0 | 6.1 | 4.8 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.2 | 8.6 | 8.4 | 7.1 | 6.3 | |
| මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස %) | කො.පා.මි.ද. (2013=100) | 5.8 | 7.3 | 6.8 | 5.2 | 5.1 | 4.9 |
| | ජා.පා.මි.ද. (2013=100) | 6.7 | 7.0 | 5.9 | 4.7 | 4.1 | |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සංඛ්‍යා සටහන 02 : මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රු. බිලි.) | | | | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දෙසැ-16 | මාර්-17 | අප්‍රේ-17 | මැයි-17 | ජුනි-17 | දෙසැ-16 | මාර්-17 | අප්‍රේ-17 | මැයි-17 | ජුනි-17 |
| සංචිත මුදල් | 856 | 892 | 886 | 860 | 892 | 27.1 | 12.7 | 16.0 | 17.3 | 17.8 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 5,406 | 5,677 | 5,731 | 5,803 | 5,873 | 18.4 | 20.0 | 20.1 | 21.4 | 21.2 |
| ශුද්ධ විදේශීය වත්කම් | -231 | -371 | -341 | -319 | -246 | 22.4 | 15.6 | 26.6 | 31.9 | 50.0 |
| ශුද්ධ දේශීය වත්කම් | 5,637 | 6,049 | 6,072 | 6,122 | 6,119 | 15.9 | 17.0 | 16.0 | 16.6 | 14.7 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 1,972 | 2,215 | 2,206 | 2,240 | 2,235 | 12.1 | 13.3 | 12.6 | 13.9 | 11.4 |
| රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබා දුන් ණය | 495 | 553 | 557 | 562 | 551 | -5.3 | 7.5 | 9.0 | 14.7 | 13.7 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 4,204 | 4,375 | 4,394 | 4,425 | 4,505 | 21.9 | 20.4 | 20.0 | 18.9 | 18.6 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 6,630 | 6,951 | 7,033 | 7,131 | 7,221 | 15.9 | 18.2 | 18.4 | 19.8 | 20.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 03: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2016 දෙසැම්බර් අවසානයට | 2017 මාර්තු අවසානයට | 2017 අප්‍රේල් අවසානයට | 2017 මැයි අවසානයට | 2017 ජූනි අවසානයට | 2017 ජූලි අවසානයට | 2017 අගෝ 02 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.00 | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.50 | 8.75 | 8.75 | 8.75 | 8.75 | 8.75 | 8.75 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 8.42 | 8.75 | 8.72 | 8.72 | 8.75 | 8.75 | 8.72 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 8.72 | 9.63 | 9.73 | 9.61 | 9.60 | 9.44 | 9.03 |
| දින 182 | 9.63 | 10.62 | 10.70 | 10.35 | 10.29 | 9.71 | 9.16 |
| දින 364 | 10.17 | 10.98 | 11.02 | 10.71 | 10.47 | 9.99 | 9.48 |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 11.52 | 11.79 | 11.78 | 11.40 | 11.70 | 12.26 | - |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 13.20 | 13.40 | 13.52 | 13.57 | 13.73 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 14.37 | 14.54 | 15.00 | 14.81 | 14.90 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 8.17 | 8.81 | 8.89 | 8.99 | 9.13 | 9.19 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 10.46 | 11.38 | 11.43 | 11.52 | 11.66 | 11.78 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 11.17 | 11.49 | 11.38 | 11.68 | 11.57 | - | - |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව